# දඹදෙණි යුගයේ පාලකයන්ගේ ශාසනික කාර්යභාරය

## Role of Rulers in Dambadeniya era on Sāsana

ආචාර්ය, ආර්.එච්.ජී. වසන්ත දිසානායක

**Absract**

A number of unique actions such as revision of Saṅgha and compilation of discourses were carried out by the four rulers, viz, Vijayabāhu III, Parākramabāhu II, Vijayabāhu IV and Bhuvanekabāhu I in Dambadeniya kingdom in order to restore the religious tradition and its membership in this country, which had been severely degraded and confused due to the brutal actions of Kaliṅga Māgha and his forces.The rulers of Dambadeniya received generous patronage to uplift the well-being of the Saṅgha through religious discourse and Saṅgha amendments. Meanwhile, for the perpetuation of Sāsana, construction of Daḷadā palace, Saṅghāvasa, renovation of existing monastery complexes and Stupas, as well as taking care of the Saṅghas' facilities and donating village land to temples were done by the above-mentioned four rulers without delay. The research problem is that through the Saṅgha amendments and Saṅgha revisions made on the patronage of the rulers of Dambadeniya was influenced for an expected good life of Saṅgha at that time. The aim of this research is to identify the deterioration of the country's political tradition during the Dambadeniya kingdom period and to find out the contribution made by the royal rulers of that kingdom to restore the state. The research method here is to compare the facts contained in the literary source such as Pūjāvaliya, Dambadeni Katikāvata, Mahāvaṅsa,

Nikāya-saṅgraha and the contemporary inscription source such as Naraṅbedda, Devuandara, Galapāta on historical experimental context.

It can be explained from the Saṅgha amendments which are considered to have been made during the periods of the rulers Vijayabāhu III and Parākramabāhu II, that due to the strict repressive policy of Kāliṅga Māgha and specifically the lack of state support for the monks community, there was a severe deterioration in the Sāsana of this country. The rulers of Dambadeniya gave their generous support by compiling Saṅgha revisions and amendments in order to avoid that degraded situation and to clean up the Sāsana, and to compile books including the Tripiṭaka to preserve the Dharma. Undeterred by that, the rulers of Dambadeniya implemented a special program for the protection of Dalada Relið and the Bowl (pātra) of the Buddha. For the welfare of the Grāmavāsī and Araññavāsī monks, the construction of Pirivenās, the restoration of old temples, the donating lands and the granting of various titles like Mahāsami and Pirivenpati were also done. With these unique measures adopted by the rulers of Dambadeniya, it can be seen that the religious tradition of this country has been restored.

**Keywords:** Saṅgha amendments, decline, monastic society, Sāsana tradition, Saṅgha revisions

**හැඳින්වීම**

සියවස් 18 කට ආසන්න කාලයක් පැවති රජරට ශිෂ්ටාචාරය කාලිංග මාඝගේ (ක්‍රි.ව. 1215) දරුණු ආක්‍රමණය හමුවේ බිඳවැටුණා පමණක් නොව, දිවයිනේ ඉතිහාසය ද වෙනස් කරමින් දිවයින; නිරිතදිග හා දකුණ පාලනය කළ සිංහල රාජධානිය වශයෙනුත්, යාපනය කේන්ද්‍ර කරගෙන ද්‍රවිඩ රාජධානියකුත් ආදි

වශයෙන් ප්‍රධාන දේශපාලන ධාරා දෙකක් යටතේ වර්ධනය වුණි. දිවයිනේ නිරිතදිග හා දකුණ කේන්ද්‍රකරගෙන නිර්මාණය වූ සිංහල දේශපාලනයේ ඉදිරියට පැමිණි නායකයන් අතුරින් සුභ නම් පර්වතය කේන්ද්‍ර කරගෙන සුභ සෙනෙවිතුමාත්, ගෝවින්ද මලය නම් පර්වතය කේන්ද්‍රකරගෙන භුවනෙකබාහු ඇපා නම් මහීපති තෙමේත්, මණිමේඛලා (මණිමෙවුලා) නම් උස්වූ ගංදෙණි නම් පර්වතය කේන්ද්‍රකරගෙන සඞ්ඛ නම් සේනාපති තෙමේත්, ශ්‍රී සඞසබෝධි රාජවංසයෙන් පැවත ආවාවූ මනෝඥ විජයබාහු යැයි ප්‍රසිද්ධ වූ රජතෙමේත් අතිශයින් උස්වූ දඹදෙණිපව් මතුයෙහි මනරම් පවුරුවාසල් යුක්ත වූ රම්‍ය වූ පුරයක් කරවා රාජත්වය හෙබ වූහ. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 3-16) යනාදි වශයෙන් මහාවංසයේ එන විස්තරයෙන් ප්‍රකට වනුයේ කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පසු ව මෙරට ඇති වූ විකේන්ද්‍රගත දේශපාලන පසුබිම යි. මෙවැනි දේශපාලන විකේන්ද්‍රගත තත්ත්වයක් තුළ එකල පැවති සියලු දේශපාලන කඳවුරු අතුරින් දඹදෙණි රාජධානිය දේශපාලනික වශයෙන් ඉදිරියට ආ බවක් පෙනී යයි.

ඉහත සඳහන් කළ දේශපාලන පරිසරය තුළ මායා රටෙහි දඹදෙණි පර්වතය කේන්ද්‍ර කරගනිමින් රාජධානියක් ස්ථාපිත කළ තෙවන විජයබාහු රජු (ක්‍රි.ව.1232-1236) එම රාජධානියේ පළමු පාලකයා බවට පත්වූයේ ය. ඔහුගේ අභාවයෙන් පසු ව දඹදෙණි රාජධානියේ පාලන නායකත්වයට පත්වන්නේ ඔහු පුත් දෙවන පරාක්‍රමබාහු රජතුමා ය. (ක්‍රි.ව. 1236-1270) (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 82. ගාථා. 1,2) කාලාන්තරයක් තිස්සේ රෝගාතුරුව වාසය කළ ඔහුගේ අවසන් පාලන කාලය ඔහු වෙනුවෙන් පාලන තන්ත්‍රය මෙහෙයවන ලද්දේ ඔහුගේ වැඩිමහල් පුත්‍ර සිව්වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු කුමාරයා විසිනි. ඔහුට ඒ සඳහා දේවපතිරාජ නම් ප්‍රධාන ඇමතිවරයාගේ සහාය ද නොවඩුව ලැබුණි. දෙවන පරාක්‍රමබාහු රජු වර්ෂ 1270 දී මියගිය බැවින් ඔහු පුත් විජයබාහු කුමරා හතර වන විජයබාහු නමින් (1270-1272) දඹදෙණි රාජධානියේ පාලන නායකත්වයට පත්විය. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 88. ගා. 1) මිත්ත නම්

සෙන්පතිවරයකු විසින් එතුමා මරණයට පත්කරමින් දඹදෙණි රාජධානියේ දේශපාලන ව්‍යාකූලත්වයක් ඇති කළ බැවින් සිව්වන විජයබාහු රජුගේ සහෝදර එසේත් නැති නම් දෙවන පරාක්‍රමබාහු රජුගේ කණිටු පුත් භුවනෙකබාහු කුමරු එම සෙන්පතිවරයා මරා දමමින් පළමු වන බුවනෙකබාහු නමින් (1272-1284) දඹදෙණි රාජධානියේ රාජත්වයට පත්වූයේ ය. ඔහු ටික කලක් දඹදෙණියේ වාසය කොට තම රාජධානිය යාපහුවට මාරු කළේ ය. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 90. ගාථා. 30-35) ඉහත සඳහන් කළ මෙම පාලකයන් සිවු දෙනා දඹදෙණි රාජධානිය කේන්ද්‍රකරගෙන පාලන නායකත්වයට පත් වූ අය වන අතර ඔවුන් සිවු දෙනා අතින් මෙරට බුදුසසුන නඟාසිටුවීම සඳහා වූ දායකත්වය එසේත් නැතිනම් ඔවුන්ගේ ශාසනික කාර්යභාරය කෙබඳු ආකාරයේ එකක් වූයේ ද? යන්න මෙයින් අධ්‍යයනයට ලක්වේ.

### දඹදෙණි රාජධානියේ පළමු පාලකයා වන තෙවන විජයබාහු රජතුමා හා ඔහුගේ ශාසනික කාර්යභාරය

පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු ව දඹදෙණිය තම පාලන මධ්‍යස්ථානය වශයෙන් ගොඩනගා ගන්නේ තෙවන විජයබාහු (1232- 1236) රජු විසිනි. මායාරට සියලු පසමිතුරන් මෙන් ම සියලු ම දෙමළ යෝධයන් පලවා හැර, වනසා දමා දඹදෙණි පව් මතුයෙහි මනරම් ප්‍රාකාර, වාසල් ආදියෙන් යුක්ත වූ රම්‍ය වූ පුරයක් කරවා එහි රජ කළේය. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 14-16) යන වංසකථා විස්තරයෙන් තෙවන විජයබාහු රජතෙමේ දඹදෙණියේ පාලන නායකත්වයට පත් වූ ආකාරය හඳුනාගත හැකි ය. ඔහුගේ රාජප්‍රාප්තිය පිළිබඳ ව මහාවංසයේ එන විස්තරය කිසිදු වෙනසක් නැතිව ඔහුට බෙහෙවින් සමකාලීන මූලාශ්‍රයක් වන පූජාවලියේ ද ඇතුළත් ව ඇත. (පූජාවලිය, 2012, පි. 785) මහාවංසයේ එන විස්තරය බොහෝ විට පූජාවලිය ඇසුරු කරගෙන රචනා කරන ලද්දක් ලෙස සැලකිය හැකි ය. රජරට තරම් මායා රට ගොවිතැනට සුදුසු භූමියක් නොවූයේ නමුත් ආරක්ෂාව අතින් මෙන් ම යුදමය අතින් මායා රට වැදගත් හෙයින් දඹදෙණිය සිය රාජධානිය වශයෙන් තෝරා ගන්නට ඇතැයි කල්පනා කළ හැකි ය.

තමන්ට පෙර සිටි රජවරු සමඟ කිසිදු ඥාති සබඳකමක් නොමැති තෙවන විජයබාහු රජු මාඝ විරෝධී බලවේග දක්ෂ ලෙස සංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දඹදෙණිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගෙන රාජත්වයට පත් වූයේ ය. ඔහු කවර රාජවංසයක් නියෝජනය කළ පාලකයෙක් ද යන්න කිව නොහැකි තරම් ව්‍යාකූල බවක් උද්ගතව ඇත්තේ ඔහුගේ පරම්පරාව පිළිබඳ ව මූලාශ්‍රයවල විවිධත්වයක් දක්නට ලැබෙන බැවිනි. මහාවංසයේ දැක්වෙන පරිදි ඔහු ශ්‍රී සංඝබෝධි රජ පෙළපතෙන් පැවතෙන්නෙකි. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගා. 10) පූජාවලියට අනුව ''මහබෝ වඩ ආ සිරිසඟබෝ වංශයෙන් නො නැසී ආ විජයබාහු නම් රජ'' (පූජාවලිය, 2012, පි. 785) එතුමා ජය ශ්‍රී මහා බෝධිය වඩම්වාගෙන පැමිණි අය අතර වූ ශ්‍රී සංඝබෝධි හෙවත් බෝධි පරම්පරාවට අයත් වූවෙකි. ''මේ ලක්දිව නසන කල්හි ශ්‍රී මහා බෝධින්වහන්සේ වඩා ගෙන ආ ශ්‍රී සඟබෝවලිය නොනැසී පැවත එන විජයබාහු රජ'' (රාජාවලිය, 2014, පි. 213) එතුමාගේ වංසය පිළිබඳ ව රාජාවලියේ එන අදහස ද පූජාවලියේ එන අදහසමයි. ඉහත සඳහන් කළ මූලාශ්‍රය ත්‍රිත්වයෙන් ම කියවෙනුයේ මෙතුමා සංඝබෝධි එසේත් නැති නම් බෝධි පරම්පරාව අයත් වූවෙක් බව ය. හත්ථවනගල්ල විහාර වංශයේ සඳහන් වනුයේ ඔහු 'බෝධිහාරක' පෙළපතින් ආ 'මෞර්ය' වංශික විජයමල්ලගේ පුත්‍රයකු බව ය. ''තතො පුබ්බේ ජයමහාබොධිදුමින්දෙන සහ සකලජම්බුදීපාධිපතිනා දිනකරකුලතිලකෙන ධම්මාසොක නරින්‍දෙන පෙසිතානං අත්තනා සමාන ගොත්තානං රාජපුත්තානං නත්තපත්තාදිපරම්පරාගතස්ස විජයමල්ලනරාධි පස්ස ඔරසපුත්තො විජයබාහු නරින්‍දො නාම රාජා'' (හත්ථවනගල්ල විහාරවංස, 2001, පි. 29) රාජරත්නාකරයේ දී ''යටකී මහබෝ වඩා ආ සිරිසඟබෝ වංශයෙන් නොනැසී ආ සිරිලක රජ පැමිණි මාඝ නම් ලද පූර්වාභිධාන ඇති කාලිඞ්ග විජයබාහු නම් මහරජ'' (රාජරත්නාකරය, 1990, පි. 32) යනුවෙන් ඔහු මහබෝධිය වඩමවාගෙන පැමිණි සිරිසඟබෝ වංශයට අයත් බවත් 'කාලඞ්ස විජයබාහු' නමින් හඳුන්වා ඇති බවත් පෙනී යයි. කව්සිළුමිණේ දී ''පාණ්ඩ්‍ය රජුගේ පරම්පරාවෙන් ආවා වූ චන්ද්‍රවංශයෙහි'' ආදි වශයෙන් තෙවන විජයබාහු රජුගේ පුත්‍රයා

වන දෙවන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ ව කරන සඳහනින් පැහැදිලි වනුයේ තෙවන විජයබාහු රජුගේ පරම්පරාව පාණ්ඩ්‍ය රජුගේ පරම්පරාව නියෝජනය කරන චන්ද්‍රවංශයට අයත් බව ය. (කව්සිළුමිණ මහා කාව්‍යය, 1992, පි. 288) දෙවුන්දර සෙල්ලිපියේ එන අදහසක් උපුටා දක්වන පරණවිතාන දෙවන පරාක්‍රමබාහු රජතුමා නැම්බරයේ සෝමරාජ පරපුරෙන් පැවත එන්නෙක් යැයි පෙන්වා දෙයි. ''දම්සොනිරිඳුසෙ නිරිඳු මුදුනත බබළා නෙමබර සොමරාජපරමපරාවෙන් පැවත ආ'' (ලංකා ඉතිහාසය, I කාණ්ඩය II භාගය, 2015, පි. 582., සුමනජෝති හිමි, 1961, පි. 202) කව්සිළුමිණෙහි හා දෙවුන්දර යන මූලාශ්‍රය ද්වයේ එන තොරතුරුවල කිසියම් සමානත්වයක් දක්නට ලැබේ. එම මූලාශ්‍රය විස්තරයන්ට අනුව තෙවන විජයබාහු රජතුමා චන්ද්‍රවංශයෙන් (සෝම) පැවත එන්නෙක් යැයි නිගමනය කළ හැකි ය.

## තෙවන විජයබාහු රජුගේ ශාසනික සේවාවන්

මාඝ නම් දරුණු ආක්‍රමණිකයාගෙන් දළදා වහන්සේ සහ පාත්‍රා ධාතුව ආරක්ෂා කරගැනීම සඳහා වාචිස්සර (වාගීශ්වර) හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා ඒවා මායාරට කොත්මලේ ප්‍රදේශයට වැඩම කරවා එහි එක් පියසෙක්හි තැන්පත් කළහ. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 17-19) එම පූජා වස්තු මේවන විට පූජනීයත්වයට මෙන් ම රාජ්‍ය උරුමයේ සංකේතයක්ව පැවති හෙයින් ඒවා අත්පත් කරගැනීම අත්‍යවශ්‍ය සාධකයක්ව පැවතුණි. තෙවන විජයබාහු රජතෙමේ මහතෙරවරු පෙරටු කොටගෙන එම කොත්මලේ පව්වට ගොස් දළදා වහන්සේට හා පාත්‍රා ධාතුවට මහත් සේ පුදසත්කාර සිදු කොට, සතුටු සිත් ඇත්තේ, ඒ ධාතු යුග්මය ගෙන, මහත් සැණකෙළි පවත්වමින් ගමින් ගමට පුරයෙන් පුරයට ගෙනවිත් සත්ජනයන්ට ප්‍රදර්ශනය කරමින් දඹදෙණි පුරයට ගෙන ගියේ ය. එම පූජනීය වස්තූන්ට දිනපතා පුද පූජා පවත්වන රජතෙමේ ඒවායේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සතුරන්ට ළඟාවීමට අපහසු ''යම්සේ අහස්හි දෙවියන් විනා පොළොවෙහි පසමිතුරු මිනිසුන් විසින් යනු නොහැකිවේද එපරිද්දෙන් බෙලිගල හාත්පසින් පව්රු දොරුටු ආදියෙන්

සුරක්ෂිත කොට ඒ ගලමත්තෙහි උතුම් වූ දංෂ්ට්‍රධාතු මන්දිරයක් දෙව්ලොවින් ආවාවූ දෙව් විමනක් මෙන් මනරම් කොට කරවා, ඒ හාත්පස ද නානාවිධ ප්‍රාසාද කරවා .... පණ්ඩිත වූ රජතෙමේ ඒ ධාතුමන්දිරයෙහි දංෂ්ට්‍රපාත්‍රධාතු යුග්මය මහත්වූ සැණකෙළියෙන් ආදර සහිතව පිහිටවූ සේක.'' (මහාවංසය, ද්විතීය භාගය, 1996 පරි. 81. ගාථා. 23-38) මහාවංසයේ එන මෙම විස්තරය එයාකාරයෙන් ම හත්ථවනගල්ල විහාරවංසයෙහි ද සඳහන් ඇත (හත්ථවනගල්ල විහාරවංස, 2001, පි. 29).

දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව තමන් සන්තක කරගනිමින් තම රාජත්වය තහවුරු කරගත් තෙවන විජයබාහු රජු විසින් එම පූජනීය වස්තූන් ආරක්ෂා කරගැනීම සඳහා ඉහත සඳහන් කළ බෙලිගල නම් ස්ථානයේ ආරක්ෂා සහිතව තැන්පත් කිරීමට කටයුතු කරන ලදි. එයින් නොනැවතුණු තෙවන විජයබාහු රජතෙමේ ධාතුන් වහන්සේලා ආරක්ෂා කිරීමෙහි නියැලී සිටි ස්ථවිරයන් වහන්සේට එම ස්ථානයෙහි ඉදිකරන ලද සංඝාරාමය පූජා කොට, දානමානාදිය ද පිරිනැමුවේ ය. (මහාවංසය, ද්විතීය භාගය, 1996 පරි. 81. ගාථා. 38, 39) මහාවංසයේ එන මෙම සිද්ධි දාමය එයාකාරයෙන් ම වඩාත් සමකාලීන මූලාශ්‍රයක් වන පූජාවලියේ ද විස්තර කොට තිබේ (පූජාවලිය, 2012, පි. 785).

දළදා වහන්සේ හා පාත්‍රා ධාතුන්වහන්සේ කෙරෙහි එයාකාර වූ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ තෙවන විජයබාහු රජතුමා ඊට අමතර ව සසුනේ චිරස්ථිතිය සඳහා වැදගත් පියවර රැසක් අනුගමනය කළ බවක් දක්නට ලැබේ. කාලිංග මාඝගේ සේනාව ''ප්‍රසිද්ධ ප්‍රශස්ත වූ බොහෝ පොත් ලණුවෙන් මුදා ඒ ඒ තැන විසිරවූහ'' (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 80. ගා. 67) යන මහාවංසයේ එන සඳහනින් පැහැදිලි වනුයේ ත්‍රිපිටකය ලියූ පුස්කොළ පොත් හා වෙනත් වටිනා කරුණු ඇතුළත් ව තිබූ පොත් පත් විශාල ප්‍රමාණයක් විනාශ වන්නට ඇති බව ය. සද්ධර්මය ලියා තිබූ බොහෝ පොත් පත් පරසතුරන් විසින් නසන්නට වූයේ යැයි දැන මහත් වූ සංවේගයට පැමිණි තෙවන විජයබාහු රජතෙමේ ධාරණ ශක්තියෙන්, ඥාන සම්පත්තියෙන්,

සැදැහත්භාවයෙන් මෙන් ම බහුශ්‍රැතභාවයෙන් ද යුක්ත වූ, කුසීත බවින් තොර වූ, ඉතා සිත්ගන්නා ආකාරයෙන් ලිවීම් කටයුතුවල නියැලී සිටි දක්ෂ උපාසකවරු මෙන් ම පොත්පත් ලියන වෙනත් බොහෝ ලියන්නන් ද එක් ස්ථානයකට රැස්කරවා ඒ සියලු දෙනා ලවා සුවාසූ දහසක් ධර්මස්කන්ධය (සමස්ත ත්‍රිපිටකය ම) මනාකොට ලියවීය. මෙම කාර්යය සඳහා සහභාගි වූ ලියන්නන්ට එම ධර්මස්කන්ධ ගණනින් ම (සුවාසූ දහසක්) රන් කහවණු දී ධර්ම පූජා ද පැවැත්වූයේ යැයි වංසකථාවේ සඳහන් ව ඇත. (මහාවංසය, ද්විතීය භාගය, 1996 පරි. 81. ගාථා. 41, 45) මහාවංසයේ එන මෙම විස්තරය කිසිදු වෙනසක් නැතිව එයාකාරයෙන් ම පූජාවලියේ ද සඳහන් ව ඇත. (පූජාවලිය, 2012, පි. 786) සද්ධර්මයේ චිරස්ථිතිය සඳහා තෙවන විජයබාහු රජතුමා විසින් සිදුකරන ලද මෙම ක්‍රියාදාමය සුවිශේෂිත වූත් වැදගත් වූත් එකක් ලෙස සැලකිය හැකි ය.

තෙවන විජයබාහු රජතුමාගේ ශාසනික ක්‍රියාදාමයන් අතර වැදගත්ම ක්‍රියාදාමයක් වන්නේ සසුනෙහි චිරස්ථිතිය සඳහා සිදු කරන ලද සංඝ සංශෝධනයයි. කාලිංග මාඝගේ විනාශකාරී ක්‍රියාපිළිවෙත නිසා ජීවිත ආරක්ෂා කරගැනීම සඳහා ඇතැම් භික්ෂූන් වහන්සේලා විදේශගත වූ අතර ඇතැම් භික්ෂූන් වහන්සේලා විවිධ උපායන් භාවිත කරමින් මෙරටම ජීවත් වූහ. රාජ්‍ය අනුග්‍රහයක් හෝ භික්ෂූන් වහන්සේලාට නිසි නායකත්වයක් හෝ නොලැබුණු බැවින් සසුන තුළ විශාල පරිහානිකර තත්ත්වයක් ඇති වී තිබෙන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. මේ තත්ත්වය මගහරවා ගැනීම සඳහා තෙවන විජයබාහු රජතුමා මෙයාකාරයෙන් සංඝ සංශෝධනයක් සිදුකරන්නට ඇතැයි නිගමනය කළ හැකි ය. ඒ බව තහවුරු කරන අදහස් කිහිපයක් මහාවංසයේ ද ඇතුළත් ව තිබේ. ''ත්‍රි සිංහලයෙහි ශීලාචාර ධුරන්ධර වූ යම් ස්ථවිර කෙනෙක් වෙත් ද මධ්‍යම කෙනෙක් වෙත් ද නවක කෙනෙක් වෙත් ද යම් සාමණේර කෙනෙක් වෙත් ද ශාස්තෘශාසන පාලක වූ ඒ සියල්ලන් රැස්කරවා අසමඟිවූවන් ද සමඟිකරවා ඉක්බිත්තෙන් ''උපසම්පදාතොමෝ ශාසනාභිවෘද්ධිය පිණිස වේ. මම ඒ මනාකොට කරවන්නෙමි නම් යෙහෙකැ'' යි

සිතා සමඟි වූ සියලු ම මහාසංඝයාට ඒ රජතෙමේ අටපිරිකරදී වැඩියක් සතුටු වූ සිත් ඇත්තේ මොනවට පටන්ගන්නා ලද පූජාසත්කාර පූර්වකොට සත්දවසක් උපසම්පදා මංගල්‍යය කරවූයේ ය. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 46-51) සංඝ සාමාග්‍රියත්, ඉක්බිත්තෙන් උපසම්පදා මහෝත්සවයත් තෙවන විජයබාහු රජුගේ මැදිහත්වීමෙන් සිදු කළ ආකාරය මෙසේ මහාවංසය වාර්තා කර තිබේ. පූජාවලියේ ද මේ විස්තරය එයාකාරයෙන් ම සඳහන් ව ඇත. (පූජාවලිය, 2012, පි. 786) ''ශාරිපුත්‍ර මහාස්වාමීන්ගේ ශිෂ්‍ය තත්කාලශාසනානු ශාසක සඞ්ඝරක්ෂිත මහාස්වාමීන් හා දිඹුලාගල වනවාසි මෙධඞ්කර මහාස්ථවිර ප්‍රමුඛ මහාසංඝයාවහන්සේ ජම්බුද්‍රොණී නම් පුරවරාසන්නයෙහි රැස්කරවා මහාසංඝයාවහන්සේ කෙරෙහි උපන් නොයෙක් විවාද මහොත්සාහයෙන් සන්සිඳුවා අමුතු කතිකාවතකුදු කරවා බොහෝ ශාසනොපකාර කළ'' (නිකාය සංග්‍රහය, 1922, පි.21) යනුවෙන් නිකාය සංග්‍රහයේ දී ද තෙවන විජයබාහු රජතුමා විසින් සංඝ සාමග්‍රියක් මෙන් ම කතිකාවතක් ද කර වූ බව සඳහන් කොට තිබේ. එතුමා විසින් සංඝ සාමග්‍රියක් මෙන් ම කතිකාවතක් සිදු කිරීම සඳහා අනුග්‍රහය දැක් වූ බව ඔහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ අවධිය සම්පාදිත දඹදෙණි කතිකාවතේ ද සඳහන් ව ඇත. (ධම්මවිසුද්ධි හිමි, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, (පෙළ) 1995, පි. 154) මෙම කටයුතු සඳහා සාරිපුත්ත සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය සංඝරක්ඛිත හිමියන් මෙන් ම දිඹලාගල විහාරවාසී මේධංකර හිමි ප්‍රමුඛ ග්‍රාමවාසී හා වනවාසී සංඝයා වහන්සේගේ සහාය රජතුමාට හිමි වූ බව මෙයින් පැහැදිලි කරගත හැකි ය. මූලාශ්‍රවල මේ ආකාරයෙන් තෙවන විජයබාහු රජදවස කතිකාවතක් සම්පාදනය වූයේ යැයි කියතත් එවැන්නක් මේ වන තෙක් සොයාගෙන නැත. කෙසේ නමුදු තෙවන විජයබාහු රජතුමා විසින් සිදුකරන ලද මෙම ක්‍රියාවලීන් දෙක ම මෙරට ශාසන සම්ප්‍රදායේ චිරස්ථිතිය සම්බන්ධයෙන් කරන ලද සුවිශේෂිත මැදිහත්වීම් ලෙස සැලකිය හැකි ය.

මාඝගේ දැඩි පාලනයෙන් අසහනයට පත් ව සිටි ජනයාට මෙන් ම භික්ෂු සමාජය ද විජයබාහු රජුගේ ආධිපත්‍යයට නතු

වීමෙන් මායා රට ක්ෂේම භූමියක් බවට පත්විය. භික්ෂු සමාජයේ සමඟිය අපේක්ෂාවෙන් සංඝ සංශෝධනයක් සිදු කිරීමට දායකත්වය දැක් වූ තෙවන විජයබාහු රජතෙමේ භික්ෂූන් වහන්සේලාගේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු නඟා සිටුවීමටත් කටයුතු කළේ ය. එයින් නොනැවතුණු රජතුමා දිවයිනේ විවිධ ප්‍රදේශවල නව ආරාම ඉදිකිරීමටත්, පැරණි ආරාම ප්‍රතිසංස්කරණය කොට සංඝයා වහන්සේට පූජා කිරීමටත් කටයුතු කළේ ය. ඔහු විසින් ඉදිකළ හා ප්‍රතිසංස්කරණය කරන ලද ආරාම කිහිපයක් පිළිබඳ විස්තර මූලාශ්‍රය තුළ සඳහන් ව ඇත. ''මිහිපතිතෙමේ ස්වකීය නාමයෙන් ලෝකයෙහි ප්‍රසිද්ධ වූ විජයසුන්දර නම් ආරාමයක් කරවා සාංඝික කොට සංඝයාට දුන්නේ ය. ''සැදැහැ ඇත්තාවූ යම් භික්ෂුහු හෝ සාමණේරවරයෝ හෝ තුන්පිටකය ඉගෙනගනිත්ද, සැමකල්හි සර්වප්‍රකාරයෙන් වාචෝද්ගත කෙරෙත්ද, ඒ සියලු වැහැන්දෑ ප්‍රත්‍ය නිසා දුක් අනුභව නොකෙරෙත්වා, කරුණාකොට මාගේ වාසලට පැමිණ අභිමත අභිමත ප්‍රත්‍ය පිළිගණිත්වා'' (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 51-55) යනාදි වශයෙන් මහාවංසයේ එන මෙම සඳහන කිසිම වෙනසක් නැතිව පූජාවලියේ ද සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 786). ඉහත සඳහන් කළ විස්තරවලින් තෙවන විජයබාහු රජතුමා විසින් දඹදෙණියේ ඉදි කළ ආරාමය පිළිබඳවත් ත්‍රිපිටකය ඉගෙන ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා යොමු කළ ආකාරයත් උන්වහන්සේලාට අවශ්‍ය කරන ප්‍රත්‍ය පහසුකම් සලසා දුන් ආකාරයත් හඳුනාගත හැකි ය.

දඹදෙණියේ විජයසුන්දරාරාමයට අමතර ව එතුමා විසින් වත්තලගම්හී (වත්තල) භික්ෂූන් වහන්සේලාට ස්වකීය නමින් විජයබාහු නමින් විහාරයක් ද කරවා සංඝයාට පිදූ බව වංසකථාවේ සඳහන් ව ඇත. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගා. 59) මෙම ආරාම නිර්මාණය පිළිබඳ විස්තරයක් පූජාවලියේ ද සඳහන්වේ. (පූජාවලිය, 2012, පි. 786) මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට මෙම විහාරස්ථානය ද එතුමාගේ නව නිර්මාණයකි. මීට අමතර ව දෙමළුන් විසින් විනාශ කරන ලද කැලණි සෑය නැවත කරවා, රන් කොත් පළඳවා, එහි ම වූ පූර්ව භාගයෙහි වහසල් කඩ ද කරවූයේ ය. එහි ම පිළිම මැදුරු පවුරු වළලු ආදිවූ අනෙක්

සියලු තන්හි ජරා ජීර්ණ ව පැවති ස්ථාන ප්‍රතිසංස්කරණය කරන ලද බව වංසකථාවේ සඳහන් ව ඇත (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගා. 60). රජු විසින් සිදු කළ මෙම කාර්යය පිළිබඳ ව පූජාවලියේ ද වාර්තා කර ඇත (පූජාවලිය, 2012, පි. 786). ඊට අමතර ව මායාරට යම් ප්‍රාසාද, පිළිමමැඳුරු, වෙහෙර, පිරිවෙන් හා එසේ ම චෛත්‍ය මණ්ඩප, ප්‍රාකාර, ගොපුර ද්වාර ආදිය පෙර පැවති ආකාරයෙන් ම නවකර්මාන්ත කිරීම සඳහා නියෝග කළ බව වංසකථාවේ සඳහන් ව ඇත (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 61,62). මෙම කාර්යයන්ට අමතර ව එතුමා විසින් හත්ථවනගල්ල විහාර සංකීර්ණයේ බොහෝ නවකම් කරමින් එම භූමිය සංවර්ධිත භූමියක් බවට පත් කළ බව හත්ථවනගල්ල විහාරවංසයේ විස්තර කොට තිබේ (හත්ථවනගල්ල විහාරවංස, 2001, පි. 30).

ඉහත පෙන්වාදුන් ආකාරයට දඹදෙණිය සිය රාජධානිය වශයෙන් තෝරාගන්නා ලද තෙවන විජයබාහු රජතෙමේ තම රාජත්වය තහවුරු කරගනිමින් දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන්වහන්සේ ඉතා ආරක්ෂිත භූමියක් වූ බෙලිගල තැන්පත් කිරීමට කටයුතු කරන ලදි. එයින් නොනැවතුණු තෙවන විජයබාහු රජු සංඝයා වහන්සේ සමඟි කිරීමටත්, උන්වහන්සේලාගේ යහපැවැත්ම වෙනුවෙන් කතිකාවතක් සම්පාදනය කිරීමටත් කටයුතු කර තිබේ. එසේ ම ත්‍රිපිටකය ආරක්ෂා කරගැනීම සඳහා ලියන්නවුන් ලවා පොත් පත් ලියවීම, ත්‍රිපිටකය පාඩම් කරගැනීමට අවස්ථාව සලසා දීම, උපසම්පදා විනය කර්ම සිදුකිරීමට අවශ්‍ය කරන සහාය ලබාදීම වැනි කාර්යයන් රැසක් ද සිදු කර තිබේ. ඉහත සඳහන් කළ ආකාරයට දඹදෙණියේ විජයසුන්දරාරාමය හා වත්තල පිහිටි විජයබාහු විහාරය ද එතුමාගේ නව නිර්මාණයන් ලෙස සැලකිය හැකි ය. එම නව නිර්මාණයන්ට අමතර ව එතුමා විසින් කැලණි විහාරය, හත්ථවනගල්ල විහරස්ථාන වැනි ස්ථාන ගණනාවක නවකම් කරමින් සංවර්ධනය කළ බවට සාධක තිබේ.

## දෙවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි. ව. 1236 - 1270)

තෙවන විජයබාහුගෙන් පසු ව දඹදෙණි රාජධානිය තුළ රාජ්‍යත්වයට පත්වනුයේ ඔහුගේ වැඩිමහල් පුත් දෙවන පරාක්‍රමබාහු ය. ඔහුගේ සහෝදරයා වූ භුවනෙකබාහු කුමාරයා උපරාජ තනතුරට පත්කළේ ය (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 82. ගාථා. 1-4). මහාවංසයේ එන මෙම කථා ප්‍රවෘත්තිය කිසිදු වෙනසක් නැතිව පූජාවලියේ ද සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 787). හත්ථවනගල්ල විහාරවංශයේ ''සම්බොධිරජ්ජප්පත්තිතො පට්ඨාය අට්ඨසතාධිකවස්සසහස්සෙ චතුවීසතියා ච වච්ඡරෙසු අතික්කන්තෙසු සම්පත්තරජ්ජාභිසෙකො'' (හත්ථවනගල්ල විහාරවංස, 2001, පි. 30) (බු.ව.1824) යන සඳහනට අනුව දෙවන පරාක්‍රබාහු රජතුමා දඹදෙණියේ රාජප්‍රාප්ත වනුයේ ක්‍රි. ව. 1236 වැන්නේ දී ය. තෙවන විජයබාහු රජතුමා මරණයට පත්වීමට පෙර පැරකුම්බා කුමරු සංඝරක්ඛිත හිමියන් ඇතුළු භික්ෂු සමූහයාට භාරදුන් බව සඳහන් වේ. (පූජාවලිය, 2012, පි. 787) පූජාවලියේ එන විස්තරය කිසිදු වෙනසක් නොමැතිව මහාවංසයේ ද සඳහන් ව ඇත (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 81. ගාථා. 76,77). මෙම මූලාශ්‍රය විස්තරවලින් පරාක්‍රමබාහු කුමාරයා රාජප්‍රාප්තියට පත් වූ ආකාරයත්, ඔහු භික්ෂූන් වහන්සේලා ඇසුරේ අධ්‍යාපනය ලැබූ ආකාරයත්, අනාවරණය කරගත හැකි ය. භික්ෂූන් වහන්සේලා හා දෙවන පරාක්‍රමබාහු රජතුමා අතර පැවති සහසම්බන්ධතාව නිසා ම ඔහුගේ රාජ්‍ය කාලය මුළුල්ලේ ම පාහේ සංඝයා වහන්සේ හා ඔහු අතර දැඩි සබඳතාවක් පැවති බවක් පෙනී යයි.

## දෙවන පරාක්‍රමබාහු රජුගේ ශාසනික කාර්යභාරය

දඹදෙණි රාජධානි අවධියේ රාජප්‍රාප්ත පාලකයන් සිවුදෙනා අතුරින් ශ්‍රේෂ්ඨත ම පාලකයා වනුයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා ය. සසුනේ අභිවෘද්ධිය හා සංඝයා වහන්සේගේ පැවැත්ම වෙනුවෙන් විශාල වැඩ කොටසක් දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් සිදු කරන්නට යෙදුණු බව තත්කාලීන මූලාශ්‍රය නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි කරගත හැකි ය. රාජත්වයට පත් වූ දෙවන

පරාක්‍රමබාහු රජුගේ පළමු කාර්යභාරය ලෙසින් සැලකිය හැකි වනුයේ පිය රජතුමා විසින් බෙලිගල තැන්පත් කර තිබූ දළදා වහන්සේ හා පාත්‍රා ධාතුන් වහන්සේ දඹදෙණියට වඩමා එහි කරවූ ඉතා රම්‍ය වූ දළදා මැඳුරෙහි තැන්පත් කරවීමයි. දළදා වහන්සේ වෙනුවෙන් මාහැඟි මාණික්‍යයක් ආධාර කොට මාණික්‍යමය වූ කරඬුවක් ද, රන් කහවණු පන්දහසකින් බබළන දෙවන කරඬුවක් ද, රිදී පස්විසිදහසකින් යුත් තුන්වැනි කරඬුවක් ද ආදි වශයෙන් කරඬු තුනක් කරවා, දළදා වහන්සේ එහි තැන්පත් කොට, රජු විසින් මහත් වූ පූජා පැවැත් වූයේ යැයි වංසකථාවේ සඳහන් ව ඇත. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 82. ගාථා. 7-15) දළදා වහන්සේ වෙනුවෙන් තම මාලිගාව සමීපයෙහි දළදා මැදුරක් ඉදිකිරීමත්, දළදා වහන්සේ එහි වඩමවාගෙන ඒමත්, දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා කරඬු නිර්මාණය කිරීමත් වැනි ඔහුගේ කටයුතු මහාවංසයේ සඳහන් ව ඇති ආකාරයෙන් ම පූජාවලියේ ද කිසිදු වෙනසක් නැතිව වාර්තා කර ඇති බවක් පෙනී යයි. (පූජාවලිය, 2012, පි. 787) දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරන්නට යෙදුණු දළදා මන්දිරය ඔහුගේ පියරජතුමා විසින් දඹදෙණියේ සිය මාලිගාවට ආසන්නයේ ඉදිකළ විජයසුන්දරාරාම භූමියේ ඉදි කරන ලදැයි හඳුනාගත හැකි ය. මෙම දළදා මැදුර දෙවන පැරකුම් රජුගේ වැඩිමහල් පුත්‍රයා වන සිව්වන විජයබාහු රජ විසින් රාජ්‍යයේ වැඩ බලන අවධියේ විශාල කරමින් විචිත්‍රවත් කරන ලද බව සඳහන් වන නමුත් වර්තමානයේ දී එම දළදා මැදුර දක්නට ලැබෙන්නේ නැත. මෙම දළදා මැදුර වර්තමාන මාලිගය යි කියන ගොඩනැගිල්ල ද නැතහොත් මේ විහාර භූමියේ ම දළදා මාලිගයේ යයි කියනු ලබන නෂ්ටාවශේෂ ද යනු හරියට ම කිව නොහැකි ය (සුමනජෝති හිමි, 1961, පි. 124).

මෙරට ශාසනික සම්ප්‍රදාය වෙනුවෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් සිදු කළ කාර්යයන් අතර සුවිශේෂිත ම කාර්යභාරය වනුයේ දඹදෙණි අවධියේ භික්ෂු සංඝයාගේ යහපැවැත්ම වෙනුවෙන් කරන ලද කතිකාවත හා සංඝ සංශෝධනයට පාලක අනුග්‍රහය දැක්වීමයි. ''ඒ ඒ තැන ප්‍රමාදව වසන ශාසනාවචර බොහෝ පුද්ගලයන්ගේ ශාසන පරිහානිකර වූ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති

බාහුල්‍යය දැනැ වත්හිමියන් වහන්සේ විසින් මහෝත්සාහයෙන් සෙමෙහි තබාලූ ශාසනය මා දවස මෙලෙස වීම අනුචිතවේදැයි සිතා ග්‍රාමාරණ්‍යවාසී කාරක සංඝයා වහන්සේ රැස්කරවා සංඝ මධ්‍යගතවැ කල්‍යාණාධ්‍යාශයෙන් යෙදී ශාසනාභිවෘද්ධිය පිණිස ආරාධනා කළෝය. ඒ අසා ශාසනොපස්තම්භකාරී අර්ථානුගත වනරතනාභිධාන බුඩවංශ මහාස්ථවිරපාදයන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය තත්කාල ශාසනානුශාසක ආරණ්‍යක මෙධංකර මහා ස්වාමි ප්‍රමුඛ ග්‍රාමාරණ්‍යවාසී කාරක මහාසංඝයාවහන්සේ විසින් පූර්ව කතිකාවත් බහා අමුතු කළ කතිකාවත මෙසේ දතු යුතු.'' (ධම්මවිසුද්ධි හිමි, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, (පෙළ) 1995, පි. 155). යනාදි වශයෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් මෙයාකාරයෙන් කතිකාවතක් සම්පාදනය කිරීමට පදනම් වූ කරුණුත් සිය පිය රජතුමාගේ දවස සිදු කළ කතිකාවතත් දැන් සසුනේ ඇති වී තත්ත්වයත් පැහැදිලි කරමින් මේධංකර හිමි ප්‍රමුඛ ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී මහා සංඝයාගේ මැදිහත් වීමෙන් සිදු කරන ලද කතිකාවත පිළිබඳ විස්තරයක් සිදු කොට තිබේ.

''මිථ්‍යාජීවයට පැමිණි අනවරතයෙන් නොසන්සුන් ඉඳුරන් ඇති සියලු අලජ්ජී සමූහයා මොනවට එක් කොට බැහැරලා සම්මාසම්බුදුන් සස්න ද පිරිසිදු කරවී. තවද ඒ රජතෙමේ බොහෝ පඬුරු සොළීරටට යවා මනාසිල් හා ආචාරයෙන් යුක්තවූ පිටකත්‍රය ධාරීවූ සොළී භික්ෂූන් ගෙන්වා තාම්‍රපර්ණියෙහි උභයශාසනය සමඟි කරවී'' (මහාවංසය, පරි. 84. ගාථා. 7-10) යනුවෙන් දෙවන පරාක්‍රමබාහු රජුගේ වැදගත්ම ශාසනික කාර්යභාරය ඉතා කෙටියෙන් වංසකථාවේ මෙසේ සඳහන් ව ඇත. මෙම කාර්යය පිළිබඳ ව නිකාය සංග්‍රහයේ සඳහන් ව ඇත්තේ පහත පරිදි ය. ''භික්ෂුභාවයට අයෝග්‍ය වූ දුශ්ශීල ශීලවිපත්තයන් පහකරවා ශාසනය ශුඩකොට ප්‍රමාදවිහාරීන්ට අවසර නොහරින ලෙස අවවාදානුශාසනකොට ... විනයානුකූලව පැවැත එන ශාසන සිරිත පස්වා දහසක් පවත්නා පරිද්දෙන් කතිකා කරවා'' (නිකාය සංග්‍රහය, 1922, පි. 22). ''දෙවනුව ශාසනෝපකාරයට පටන් ගෙන, අරාජිතයෙහි බොහෝ කලක් ස්වච්ඡන්දචාරී ව විසූ අලජ්ජී පුද්ගලයන් තෝරා ශාසනය පරිශුද්ධ කරවා, නැවත සොළී රජයට

නො එක් පඬුරු පාක්කුඩම් යවා, එහි වසන භික්ෂූන් සිංහලයට ගෙන්වා උභය ශාසනය ම සමඟ කළහ'' (පූජාවලිය, 2012, පි. 791). යනුවෙන් රජුට වඩාත් සමකාලීන මූලාශ්‍රයක් වන පූජාවලියේ ඒ බව සඳහන් ව ඇත. ඉහත සඳහන් කළ සියලු ම මූලාශ්‍රවලින් පැහැදිලි වනුයේ සිය පිය රජතුමා විසින් සිදුකළ ශාසනික මැදිහත්වීමට පසු ව ඉතා නොබෝ කලක් තුළ දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් කතිකාවතක් මෙන් ම සංඝ සංශෝධනයක් සිදු කිරීමට දායකත්වය ලබා දී තිබෙන බව ය.

ඉහත සඳහන් කළ ශාසනික කටයුතුවලට අමතර ව එතුමා විසින් සසුනේ අභිවෘද්ධිය සඳහා කටයුතු රැසක් ම සිදු කළ බව මූලාශ්‍රයෙන් හඳුනාගත හැකි ය. එතුමාගේ රාජත්වයෙන් එකොළොස්වන වර්ෂයේ දී ජාවක රටින් පැමිණි චන්ද්‍රභානු නම් තැනැත්තෙක් ආක්‍රමණයක් දියත් කළ අතර එය සිය බෑනා කෙනකු වූ වීරබාහු ලවා ජයග්‍රහණය කිරීමට පරාක්‍රමබාහු රජුට හැකි විය. ජයග්‍රහණයෙන් පසු ව දෙවිනුවර උපුල්වන් දේවාලයට ගොස් වන්දනාමාන කොට 'පිරිවෙණක් එතුමා විසින් ම කරවූ බවත් එය ජනයා සතුටු කරවන ලද බැවින් 'නන්දන' නම් වූ බවත් මහාවංසයේ සඳහන් ව ඇත. (මහාවංසය, ද්විතීය භාගය, පරි. 83. ගාථා. 36-50) මෙය වීරබාහු මාපා විසින් ඉදිකරන ලද නමුත් එය පැහැදිලි ලෙස ම දෙවන පරාක්‍රමබාහු රජුගේ උපදෙස් මත ඉදිකරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

චන්ද්‍රභානු පරාජයට පත් කිරීමෙන් පසු ව දඹදෙණියට පැමිණි දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ 'බුදුන් දහම් අයත්වූ ගම් අරම් ආදිය ද, කැපවූ පසගම් ද, ගණසතු ගම් ද, එසේ ම පුද්ගල ගම් ද, පිරිවෙන් අයත් ගම් ද නියම කරවා ඒ ඒ තැන්වලට ලබාදුන් බව සඳහන් වේ. (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 4,5) විවිධ ආර්ථික අපහසුතා මත ගතකළ එම ගම්බිම් ලද විහාරස්ථාන, පරිවෙන් හා අෂ්ටායතන නැවත ආර්ථික අතින් ශක්තිමත් වන්නට ඇතැයි කල්පනා කළ හැකි අතර එම කාර්යයන් සසුනේ චිරස්ථිතිය සම්බන්ධයෙන් ගත් ඉතා වැදගත් තීරණ ලෙසින් සැලකිය හැකි ය.

භික්ෂූන් වහන්සේලාගේ ශීලවන්ත හා ගුණවන්ත බව පිළිබඳ ව සැලකිලිමත් වූ දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ මේ වන විට තම්බරට්ටෙහි (තඹලිංගමුවෙහි) අතිශය ප්‍රසිද්ධව සිටි ශීලවන්ත ගුණෝපේත ධම්මකිත්ති යතීන්ද්‍රයන් වහන්සේ විවිධ පුදපඬුරු යවමින් මෙරටට වඩමවාගෙන අවුත් උන්වහන්සේට විවිධාකාර වූ පුද පූජා පැවැත් වූ බව වංසකථාවේ සඳහන් වේ. (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 11-16) තමලිංගමුවෙහි වාසය කරන දෙළොස් දහසක් භික්ෂූන් වහන්සේලා අතුරෙන් අතිශය ශීලවන්ත භික්ෂුවක් වූ ධම්මකිත්ති හිමියන් මෙරටට වඩමවාගෙන ආ බව පූජාවලියේ ද සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 791) උන්වහන්සේගේ දිවි පැවැත්ම පිළිබඳ ව සැලකිලිමත් වූ බොහෝ භික්ෂු සංඝයා යහපත් පැවිදි දිවියක් ගොඩනඟා ගැනීමට උත්සුක වූවාට සැක නැත. ඒ අනුව තම්බ රට්ටෙහි ධම්මකිත්ති හිමියන් මෙරටට වඩමවාගෙන ඒම එකල සසුනේ අභිවෘද්ධියක් ඇති වීම කෙරෙහි කිසියම් බලපෑමක් සිදුකරන්නට ඇතැයි කල්පනා කළ හැකි ය.

ඉහත සඳහන් කරන ලද කටයුතුවලට අමතර ව එතුමා විසින් රාජධානිය හාත්පසින් අෂ්ටායතනවාසී වූ මහතෙරුන් අටදෙනා වහන්සේගේ හා ගම්වැසි ස්මෘතිමත් තෙරුන් වහන්සේලාගේ ද වාසස්ථාවලට යෝග්‍ය වූ විශාල ප්‍රාසාද, දිවාස්ථාන, චඞ්කමනස්ථාන සහිත සංඝාරාම ඉදිකරවා උන්වහන්සේලා වෙත පූජා කරන ලදී (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 17-21., පූජාවලිය, 2012, පි. 791). මෙම කටයුත්තෙන් පසු ව රජ තෙමේ ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී වූ මහාසංඝයා වහන්සේ රැස්කරවා ඔවුන් අතුරින් ශීලවන්ත ජීවිතයක් අපේක්ෂා කරන ධූතංගධාරී වූ දැඩි ප්‍රතිපත්තීන්හී යෙදී සිටින ඍජුගති ඇති භික්ෂු සමූහයා පලාබද්ගලට රැස්කරවා ආරණ්‍ය වාසයන් කරවා උන්වහන්සේලා වෙනුවෙන් ද ඇප උපස්ථාන කළේ ය (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 22-24., පූජාවලිය, 2012, පි. 791). මහාවංසයේ එන ඉහත සඳහන් කළ විස්තර කිසිම ආකාරයක වෙනසක් නැති ව එලෙසින් ම පූජාවලියේ ද සඳහන් ව ඇත.

''තවද ලක්දිව ආගම ධර ස්ථවිරයන් එවකට මඳ ව ගිය හෙයිනුත්, පත්, පොත් නිමවා නැති හෙයිනුත්, දඹදිවින් පොත් ගෙන්වා සියගණන් ස්ථවිරයන් ආගම ධරකරවා, බුදුන්ට පයඹ්ප්ති පූජා කරවූහ.'' පූජාවලියේ එන මේ විස්තරය මහාවංසයේ තුළ ද සඳහන් ව ඇත. මූලාශ්‍රය ද්විත්වයේ ම එන අදහස්වල වෙනස් බවක් දක්නට ලැබෙන්නේ නැත (පූජාවලිය, 2012, පි. 791., මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 26-28). කෙසේ නමුදු මූලාශ්‍රය ද්විත්වයෙන් ම කියැවෙන කරුණ වනුයේ ත්‍රිපිටකය ඉගෙන ගැනීම සඳහා අවශ්‍ය කරන පොත් පත් ආදිය සුලභ කරලීමට දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ කටයුතු කළ බව ය. මෙයින් නොනැවතුණු රජතෙමේ සිය සහෝදරයා වූ භුවනෙකබාහු පිටකත්‍රයෙහි හික්මවා එහි විශාරදයෙක් කරවා ඔහු ලවා ම ස්ථවිර ධර්මය දේශනා කරවා අසන්නා වූ බොහෝ භික්ෂූන් වහන්සේලාට මහ සංඝයා මධ්‍යයෙහි ථෙර සම්මුති දෙවා සියලු පිරිකර දී ථෙර පූජා ද පැවැත් වූයේ ය (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 29-31., පූජාවලිය, 2012, පි. 791).

ඉහත සඳහන් කළ ශාසනික දායාදයන්ට අමතර ව දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ''අට වරෙකදී ටැම් ඇති මහ ගෙයක් කරවා, ඒ හාත්පස උතුම් මහ මඩුවක් කොට, එහි භික්ෂු සංඝයා වඩා හිඳුවා විවිධ පුද පූජා පවත්වමින් හෙරණ පැවිදි බොහෝ දෙනාට උපසම්පදාව දෙවා, පසු ව තෙර (පදවිය) මහ තෙර (පදවිය) ආයතන (පදවිය) යනාදි වූ උතුම් තනතුරු ද භික්ෂූන්ට දෙවා ඊට අනතුරු ව මාහැඟි බොහෝ ගරු නාමයන් ද භික්ෂූන් වහන්සේලාට දෙවී ය.'' ''... එසේ ම තමන්ගේ නමින් පරාක්‍රමබාහු නමින් පිරිවෙනක් ද කරවා ...'' (මහාවංසය, ද්විතීය භාගය, පරි. 84. ගාථා. 29-31, පරි. 85. ගාථා. 57,58). එසේ ම බොහෝ වර උපසම්පදා මංගල්‍ය කරවා බුදුසසුන සමෘද්ධ කරවීය. යනුවෙන් වංසකථාවේ එන විස්තරවලින් පැහැදිලි වනුයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් සසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් භෞතික සම්පත් මෙන් ම මානව සම්පත වඩාත් දියුණු තත්ත්වයකට ගෙනා බව ය. මහාවංසයේ සඳහන් ව ඇති පරාක්‍රමබාහු පිරිවෙන පිළිබඳ සඳහනක් දෙවන පරාක්‍රමබාහු

රජතුමාට අයත් නාරංබැද්දේ ශිලා ලේඛනයේ ද සඳහන් ව ඇත. මූලාශ්‍රය ද්වයේ ම සඳහන් ව ඇති පරාක්‍රමබාහු පිරිවෙන එකක් ම විය යුතු ය. ''... සෙල විහාරය කරවා පරාක්‍රමබාහු පිරිවනයයි නම් ද දී මෙමැ දෙමින ...'' (සුමනජෝති හිමි, 1961, පි. 201). යනුවෙන් නාරංබැද්ද ශිලා ලේඛනයේ එය සඳහන් ව ඇත.

ඉහත සඳහන් කළ මහහැඟි ශාසනික දායාදයන්ට අමතර ව දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් කරන ලද කරවන ලද නව නිර්මාණ මෙන් ම ප්‍රතිසංස්කරණයට ලක්කරන ලද පූජා භූමි පිළිබඳ විස්තරයක් පූජාවලියේ මෙන් ම මහාවංසයේ ද සඳහන් ව ඇත. එම මූලාශ්‍රය ද්වයේ ම පහත එන විස්තරය එක හා සමාන ය. ''තවද තමන් නමින් පරාක්‍රමබාහු නම් පිරිවෙනක් කරවා, නො එක් කප්පිය භාණ්ඩ දරුගම් වටනා පස එම වෙහෙර ලවා මහත් වූ පූජා කළහ. තව ද භුවනෙකබාහු නම් මල් යුවරජු ලවා බෙලිගල් පායෙහි ඔහු නමින් පිරිවෙනක් හා රජමහා විහාරයක් කරවා, ශ්‍රී වර්ධනයෙහි කී පරිද්දෙන් ම සද්දවසක් මහත් වූ තුනුරුවන් පූජා කැරවූහ. තව ද ඔවුන් ලවා ම කුරුණෑගල් පායෙහි එසේ ම රාජමහා විහාරයක් කරවා, ඔහු නමින් ම මහෙන්ද්‍රබාහු පිරිවෙන කරවා, එසේ ම මහපූජා කැරවූහ. තව ද කැලණි වෙහෙර යටාලතිස්ස රජ කැරවූ පස්මහල් මහපාය කටුකොහොල් පෙරළවා, එහි ම ඔත් පිළිම ගෙය, කටුකොහොල් පෙරළවා, තව ද එම වෙහෙර ත්‍රිවඞ්ක ගෙය කටුකොහොල් පෙරළවා, එහි ම මහවෙහෙර සිසාර සලපතර අතුරුවා, එම වෙහෙර අභිමුඛයෙහි මහා මණ්ඩපයක් කරවා, ... තව ද අත්තනගලු වෙහෙර දැහැමි සිරි සඟබෝ රජහු ඉස දන් දුන් තැන ගෝඨාභය රජහු විසින් කැරවූ දෙමහල් වටදා ගෙය තුන්මහල් කොට කරවා, එම වෙහෙර තමන් පියරජහුගේ දේහ නිඃක්ෂේප ස්ථානයෙහි මහසෑය බඳවා, එහිම අෂ්ටාංශ වූ ප්‍රතිමා ගෘහයක් කරවා එහි සල පිළිම වඩා නො එක් වාරයෙහි පූජා කළහ'' (පූජාවලිය, 2012, පිටු. 793,794., මහාවංසය, ද්විතීය භාගය, පරි. 85. ගාථා. 57-77). යනුවෙන් ඔහුගේ ශාසනික කටයුතු ඉහත සඳහන් කළ මූලාශ්‍රයද්වයේ සඳහන් කර ඇත. ''දඹදෙනි අවදියේ මිත් සෙනෙවිරදුන් කැර වූ කැලණියේ ලංකාතිලක ගේ'' නියම්ගම්පාය ශිලා ලේඛනයට අනුව කැලණියේ ලංකාතිලක

ගෙය ඉදි කර ඇත්තේ මිත් සෙනෙවිරදුන් විසිනි. (ගුණාලඞ්කාර වරසම්බොධි හිමි, 2019, පි. 89)

ආගමික ලෝකයත් සමග දැඩි සබඳතාවක් ගොඩනගා ගෙන සිටි දෙවන පරාක්‍රමබාහු රජතුමා සසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් කරන ලද මෙහෙවර මෙතැකැයි කියා නිමකිරීමට බැරිතරම් අති විශාල ය. අනුබුදු මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ දළදා වහන්සේලා බෙන්තොට දළදා ගෙයි වැඩ සිටින්නේ යැයි අසා එහි ගොස් දළදා වහන්සේ විවිධ පූජාවන්ගෙන් පිදී ය. එම ගමනේ දී දෙවුනුවර දෙවුරජාණන්ගේ රජගෙය ජරාවාස ව තිබුණේ යැයි දැක ප්‍රතිසංස්කරණය කොට, අවුරුදු පතා ඇසළ පූජා පැවැත්වීමට කටයුතු කළේ ය. සිය පියා කරවූ විජයසුන්දරාමයේ මහපවුරු බඳවමින් එහි තුන් මහල් අලුත් දළදා මන්දිරය ඉතා විචිත්‍රවත් සිතුවමින් අලංකාර කොට මහත් වූ පුද පූජා පැවැත්වීය. එයින් නොනැවතුණු රජතුමා විසින් බුදුන් වහන්සේගේ ජීවමාන බුද්ධ රූපය හා සමාන බුදුරුවක් පෙතිකඩක අන්දවා ලක්දිව බොහෝ සංඝයා හා මහජනයා රැස්කොට දවස් හතක් දිවා රාත්‍රියේ මහත් වූ උත්සවයක් පවත්වන ලදී (පූජාවලිය, 2012, පිටු. 794., මහාවංසය, ද්විතීය භාගය, පරි. 85. ගාථා. 78-98).

විවිධාකාර වූ මලුකම් රැසක් කරවන්නට යෙදුණු රජ තෙමේ පැවිදි උපසම්පදා වූ භික්ෂූන් වහන්සේලාට කැපකරු දායකයකු වෙමින් විවිධ වූ පූජා සත්කාර සම්මාන කරන්නට යෙදුණේ ය. එසේ ම කඨින පිංකම් පිළිබඳ ව අසා දැනගත් රජ තෙමේ පෙර නොවූ විරූ කඨින පිංකමක් පවත්වන්නේ යැයි සිතා ලක්දිව බොහෝ ස්ත්‍රී පුරුෂයන් රැස් කොට, කපු නූල් සකස් කරමින් කඨින චීවර අසූවක් සකස් කොට මහත් වූ කඨින පූජෝත්සවයක් පවත්වන ලද බව පූජාවලියේ මෙන් ම වංසකථාවේ ද සඳහන් ව ඇත. එසේ ම දන් දීම සම්බන්ධයෙන් මහත්සේ රුචි වූ රජ තෙමේ තාම්‍රපර්ණී දිවයින් වැසි සියලු ම තෙරුන් වහන්සේලාට දන් දුන් බව ද එහි සඳහන් ය (පූජාවලිය, 2012, පි. 795., මහාවංසය, ද්විතීය භාගය, පරි. 85. ගාථා. 99-107). බුදුන් වහන්සේ කෙරෙහි මහත් වූ ප්‍රසන්න හැඟීමකින් පසු වූ දෙවන පරාක්‍රමබාහු රජ

තෙමේ නොයෙක් වර ලක්රජයෙන් බුදුන්වහන්සේ පුදන්නේ යැයි සිතා තමාගේ රාජභවනයත් සිංහාසනයත් අලංකාර කොට දළදා වහන්සේ සිංහාසනයෙහි තැන්පත් කොට මහා සංඝයා මධ්‍යයෙහි සුවිශේෂිත වූ පූජා මහොත්සවයක් පවත්වමින් පුද පූජාවට ලක් කළ බව මූලාශ්‍රයවල සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 797., මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 85. ගාථා. 109-117).

ඉහත සඳහන් කරන ලද ආගමික කාර්යයන්ගෙන් නොනැවතුණු දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ තමන්ට බෙහෙවින් ම හිතෛෂී ව කටයුතු කළ දේව ප්‍රතිරාජ ඇමතිවරයා කැඳවා ඔහු ලවා ආගමික කාර්යයන් රැසක් සිදුකරන්නට යෙදුණු බව මූලාශ්‍රය තුළ සඳහන් ව ඇත. සමනොල පව්වට යන මාර්ගය ඉතා දුෂ්කර එකක් යැයි දැන එහි යන අයට ගමන් මාර්ගය වඩාත් පහසු කරලීම සඳහා දේවප්‍රතිරාජ ඇමතිවරයා ලවා සමනොල කන්දට යන මාර්ගත්, අත්තනගල්ල පුදබිමෙහි උපතිස්ස නම් රජකු විසින් කරවන ලද පස්මහල් රන් උළු මහපායත් ප්‍රතිසංස්කරණය කරවී ය. මීට අමතර ව ඔහු ලවා බෙම්තොට නිස්සංක මහ පැලාන සේ ම පරාක්‍රමබාහු රජ නමින් උයනක් ද කරවී ය. මෙම කාර්යයන් පිළිබඳ ව දිගු විස්තරයක් පූජාවලියේ හා මහාවංසයේ සඳහන් ව ඇත. එම මූලාශ්‍රය ද්වයෙහි සඳහන් ව ඇති ආකාරයට දේවප්‍රතිරාජ තෙමේ පළමුව ගම්පොළ නුවරට ගොස් සමන් දෙවිරජාණන්ගේ රූපය රත්රුවන් පළඳනාවන්ගෙන් ජීවමාන රූපයක් සේ කරවා මහත් උත්සවශ්‍රීයෙන් සමනොළ පව්ව වෙත ගොස් ''ඒ ඒ තන්හී අරම් අම්බලම් කරවා ... තම රජහු නමට රාත්‍රි පහනක් පුදා ... බොහෝ කලක් රජහුගේ කීර්ති ශරීරය පවත්නා සේ එහි ශිලාලේඛන කොටවා එපවත් රජහට සැලකොට යවා, නැවත අත්වනු ගල් ගොස් ඒ පාය රජු කී පරිද්දෙන් ම නො එක් ධන පරිත්‍යාග යෙන් තුන් මහල් කොට කරවා අනෝමදස්සි නම් මාහිමියන්ට පිළිගන්වා, එයින් බෙම්තොට ගොස් කළු හෝ මුවදොර සයාසූරියන් මහ හෙයක් ද'' ආදි වශයෙන් දේවප්‍රතිරාජයන් රජු වෙනුවෙන් ආගමික කාර්යයන් මෙන් ම සංවර්ධන කාර්යයන් රැසක් සිදුකරන ලදි (පූජාවලිය, 2012, පි. 795, 796., මහාවංසය, ද්විතීය භාගය, පරි. 86. ගාථා. 18-48).

මහලු වියට පත් දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ සිය පුත්‍රයන් වන විජයබාහු, භුවනෙකබාහු, ත්‍රිභුවන මල්ල, පරාක්‍රමබාහු සහ ජයබාහු යන පුත්‍රයන් පස්දෙනා හා වීරබාහු නම් බෑන රජු යන සදෙනා ළඟට කැඳවා ඔවුන්ට නියම පියකුගේ පුතෙක් වන්නේ කවරෙක් ද යන්න මතක් කරමින් සියලු දෙනාගේ අදහස් සැලකිල්ලට භාජනය කරමින් තමන්ගෙන් පසු ව රාජ්‍ය ආරක්ෂාව භාර ගැනීමට නියම සුදුස්සා ලෙස වැඩිමහල් පුත් සිව්වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු කුමාරයාව තෝරා ගත්තේ ය. විවිධ හේතු සාධක නිසා තමන් අතින් විය යුතු ව තිබූ රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණ කටයුතු ආදිය සිදු කිරීමට අතපසු වූ බවත් එම අතපසු වූ කටයුතු සිදුකරන්නේ නම් මැනවැයි සිහිපත් කරමින් රාජ්‍යභාරය ඔහුට පවරා දෙන ලදි.

## සිව්වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු රජුගේ ශාසනික කාර්යභාරයන්

දෙවන පරාක්‍රමබාහු රජු විසින් තමන්ට නියම කළ ශාසනික කාර්යයන් නොපිරිහෙළා ඉටුකිරීමට බෝසත් විජයබාහු කුමාරයා කටයුතු කළේ ය. වීරබාහු කුමාරයා සිය කටයුතුවලට එක්කරගත් බෝසත් විජයබාහු කුමාරයා පළමුව කෙබඳු වූ පිංකමක් කරන්නේ දැයි කල්පනා කරන්නේ සිය පිය රජතුමා විසින් දඹදෙණියේ නිර්මාණය කරන ලද දළදා මැදුර මේ වන විට ජීර්ණව පවතින බැවින් එහි නවකම් කළ යුතු යැයි කල්පනා කොට පැරණි දළදා මැදුර ඉතා සිත්ගන්නා ආකාරයෙන් ප්‍රතිසංස්කරණය කොට එහි දළදා වහන්සේ මෙන් ම පාත්‍රා ධාතුව තැන්පත් කොට වෙනදාටත් වඩා ඒ සඳහා පුද පූජා පවත්වන්නට කටයුතු කළේ ය (පූජාවලිය, 2012, පි. 800., මහාවංසය, ද්විතීය භාගය, පරි. 88. ගාථා. 11-16).

මෙම කාර්යය බෝසත් විජයබාහු රජු විසින් සිදු කළ පළමු ශාසනික කාර්යභාරය ලෙසින් හඳුනාගත හැකි ය. මෙම කාර්යයෙන් පසු ව වීරබාහු කුමාරයා හා එක්ව රාජ්‍යයේ විවිධ ප්‍රදේශවලට ගමන් කළ බෝසත් විජයබාහු රජ තෙමේ ආගමික කාර්යයන් රැසක් සිදු කිරීමට කටයුතු කළේ ය. වාගිරිගල ප්‍රදේශයට

ගිය එතුමා එහි ගල මුදුනෙහි යහපත් සංඝාරාමයක් ඉදි කොට එය මහනෙත් පාමුල මහා ස්ථවිරයන් වහන්සේට පිළිගැන්වීය. එයින් පිටත් වූ රජ තෙමේ සමනොල පව්වට ගොස් ශ්‍රී පාදය පුදා, එයින් ගම්පොළ නුවර වැද, එහි වූ නියම්ගම්පාය විහාරස්ථානය කටුකොහොල් පෙරළවා (ප්‍රතිසංස්කරණය කොට) නිති දන් පිරි නැමී ය. එයින් සිඟුරුවානයට ගොස් එහි වල්ගම්පායෙහි නව කර්මාන්ත කරවා, නිමවා පියරජහු නමින් අභය රාජ නමින් පිරිවෙනක් කර වූයේ ය. එයින් නික්මුණු ඔහු කුරුණෑගලට ගොස් සිය සුළු පියා විසින් ඉදි කළ රජමහා විහාරයෙහි මහ බුදු පිළිමය කරවා එහිම සිය සුළු පියාගේ නමින් එනම් භුවනෙකබාහු පිරිවෙන නමින් පිරිවෙනක් ද ඉදිකරන්නට යෙදුණි (පූජාවලිය, 2012, පි. 801., මහාවංසය, ද්විතීය භාගය, පරි. 88. ගාථා. 44-59).

''අනුරාධපුර නුවර ගොස් මහසෙනග ලවා දෙනානකයෙහි තඹරුප් - ශ්‍රී මහා බෝධි - ලෝවා මහා පා - රුවන්මැලිමළු ආදි තන්හි වල් සිඳුවා, වැලිමළු තනවා, ඒ ඒ තන්හි ගිය නුවර වාසීන් ගෙන්වා රුවන්මැලි මහසෑයෙහි පියරජහු කරවා නො නිමි කර්මාන්ත කරවන සේ නියෝග කොට, සෙනෙවිරත් පිරිවෙන් ආදිවූ මහාසංඝයාට දාන වෘත්ති තබා දී ... එයින් පොළොන්නරු මූල රාජධානියට වැද, බොහෝ කලක් නැසී තිබූ සියගණන් වෙහෙර සුසන් හා බිම් පමණක් තිබියදී ... තුන්වනුව ලඞ්කාතිලකාදි වෙහෙර සසුන් කරවා'' (පූජාවලිය, 2012, පිටු. 802, 803., මහාවංසය, ද්විතීය භාගය, පරි. 88. ගාථා. 80-87) ආදි වශයෙන් එන මූලාශ්‍රය විස්තරවලින් සිව්වන විජයබාහු රජ තෙමේ පිය රජුගේ අණ පරිදි ඔහු වෙනුවෙන් අනුරාධපුර රාජධානියේ හා පොළොන්නරු රාජධානියේ පිහිටි වෙහෙර විහාර රැසක නවකම් කළ බව පැහැදිලි කරගත හැකි ය. මේ සියලු ආගමික කාර්යයන් දෙවන පරාක්‍රමබාහු රජතුමා ජීවත්ව සිටි අවධියේ ඔහුගේ අභිමතය හා ඉල්ලීමට අනුව රාජ්‍ය ආරක්‍ෂාව භාරව කටයුතු කළ බෝසත් විජයබාහු කුමාරයා විසින් සිදු කරන්නට වූ ඒවා ය.

අනුරාධපුරයේ හා පොළොන්නරුවේ පිහිටි ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ව නැවතත් දඹදෙණියට

පැමිණි බෝසත් විජයබාහු රජතුමා දඹදෙණියේ දළදා මැදුර තවත් අලංකාර කරමින් දළදා වහන්සේ වෙනුවෙන් අත්‍යාලංකාර පුද පූජා පවත්වන්නට යෙදුණු බවත් මේ සියලු පූජාවන් පිළිබඳ විස්තර පිය රජතුමාට දන්වා යැවූ බවක් පූජාවලියේ මෙන් ම මහාවංසයේ සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 804., මේ පූජා කර්ම පිළිබඳ දිගු විස්තරයක් මහාවංසයේ සඳහන් ව ඇත. (මහාවංසය, ද්විතීය භාගය, පරි. 89. ගාථා. 13-46).

දඹදෙණියේ සිදු කළ මෙම වැදගත් කාර්යයන්ගෙන් පසු ව සසුන තව දුරටත් පිරිසිදු කිරීමට කටයුතු කළ සිව්වන විජයබාහු රජ තෙමේ මහවැලි නදියේ 'දහස්තොටදී උපසම්පදා මංගල්‍යය නිර්මල කොට කරවන්නෙමි යැයි කියා පළමුකොට වීරබාහු මහීපාලයන් යවා උහු විසින් මනොඥවූ නොයෙක් දහස් ගණන් සංඝාරාමයන් සහ නානාවිධාලංකාරයෙන් බබලන්නා වූ ... මහා මන්දිරයක් කරවා එහි උපසම්පදා විනය කර්මය සිදු කරන බවත්, උපසම්පදා අපේක්ෂිත සියලු සංඝයා වහන්සේ එහි රැස්වන ලෙසත් අඬ බෙර යැවී ය. උපසම්පදා වීමට අපේක්ෂාවෙන් පසු වූ සියලු දෙනා වහන්සේ එහි රැස් වූ බවත් අඩමසක් තිස්සේ උන්වහන්සේලාට දානමානාදියෙන් සංග්‍රහ කරමින් උපසම්පදා මහෝත්සවය' පැවැත් වූයේ යැයි මූලාශ්‍රයේ සඳහන් ව ඇත (පූජාවලිය, 2012, පි. 804., මහාවංසය, ද්විතීය භාගය, පරි. 89. ගාථා. 47-63). මෙම උපසම්පදා විනය කර්මයෙන් පසු ව මාහිමි පදවිය, එසේ ම මුල් පදවිය, මහතෙර පදවිය, තෙර පදවි, පරිවෙන් ආදි පදවි ද ඒවා ලැබීමට යෝග්‍ය වූ යතීන්ට දෙවා, විවිධ වූ පිරිකරවලින් සංඝයා වහන්සේ පුදා ''නුවණ පෙරටුකොට යම් යම් පිණක් මා විසින් කරන ලද්දේ ද ඒ සියල්ල පියරජාණන් නමින් ම කරන ලද්දේය'' යි දන්වා පියරජාණන් වෙත දූතයෙක් යැවුයේ ය'' (මහාවංසය, ද්විතීය භාගය, පරි. 89. ගාථා. 64 - 70). මේ ආකාරයෙන් මහවැලි ගඟෙහි දහස්තොට දී උපසම්පදා මංගල්‍යයන් පවත්වා නවාංග සත්ථු ශාසනය බැබලවී ය.

මේ ආකාරයෙන් දෙවන පරාක්‍රමබාහු රජ තෙමේ සිය වැඩිමහල් පුත්‍රයා වූ හතරවන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු

කුමාරයා වෙත රාජ්‍යභාරය තබා තමන්ගේ අභිරුචිය පරිදි නොයෙක් පිංකම් සිය පුත්‍රයා ලවා කරවා තමන්ගේ රාජත්වයෙන් තිස් පස්වන වර්ෂයේ දී ස්වර්ගස්ථ විය. තම පිය රජුගේ මරණින් පසු ව රාජ්‍යභාරය සියතට ගත් සිව්වන විජයබාහු රජුගේ දෙවන රාජ්‍ය වර්ෂයේ දී මිත්‍ර නම් පවිටු ඇමැතියකු විසින් දාසයකු ලවා රජතුමා මරණයට පත්කරවන ලදි. (පූජාවලිය, 2012, පි. 805., මහාවංසය, ද්විතීය භාගය, පරි. 89. ගා. 71)

## පළමු වන භුවනෙකබාහු රජතුමාගේ ශාසනික කාර්යභාරය

සිය සහෝදරයා මරණයට පත්කරමින් දඹදෙණියේ සිංහාසනය පැහැරගත් මිත්‍ර නම් ඇමැතිවරයා මරා දැමීමට කටයුතු කළ සහෝදර භුවනෙකබාහු කුමාරයා සිංහාසනාරූඪ කරවන ලද්දේ මේ කාර්යයට නායකත්වය දුන් ආර්යය - සිංහල යන උභය පක්ෂයගත් හමුදා භටයන් විසිනි. වසර කිහිපයක් දඹදෙණියේ වාසය කළ මෙතුමා එම රාජධානිය අත්හැර යහපව් නුවරට ගොස් එහි රාජධානියක් ඉදිකර වාසය කළේ ය. එතුමා විසින් කරන ලද ශාසනික කටයුතු අතර වඩාත් වැදගත් කාර්යය වන්නේ ධර්ම පුස්තක ලියන්නන්ට බොහෝ වස්තු දෙමින් ත්‍රිපිටකය ලියවා ලංකාද්වීපයෙහි ඒ ඒ විහාරස්ථානයන්හී තබා පාලි ධර්මාභිවෘද්ධිය ඇති කරවීමයි. මෙම කාර්යයෙන් නොනැවතුණු රජ තෙමේ සසුනෙහි අභිවෘද්ධිය පිළිබඳ ව සැලකිලිමත් වූයේ උපසම්පදා මංගල්‍යය සිදුකිරීමට ද අනුග්‍රහය දැක්වූයේ ය. හෙතෙම දළදා වහන්සේ වෙනුවෙන් දවසක් දවසක් පාසා පුද පූජා පැවැත්වීය. (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 90. ගාථා. 36-42) මහලු බුවනෙකබාහු රජතුමා විසින් ධූමද්‍රෝණි නම් ආවාසයක් අලුත්වැඩියා කර සුමංගල නම් භික්ෂුවකට පූජා කළ බව පයෝග සිද්ධි නම් ග්‍රන්ථයේ සඳහන් ව ඇති බවට සුමනජෝති හිමියන්ගේ ග්‍රන්ථයේ එන විස්තරයකින් තහවුරු කරගත හැකි ය (සුමනජෝති හිමි, ක්‍රි.ව. 1961, පි. 129).

## දඹදෙණි රාජධානි අවධියේ විවිධ පාලකයන් විසින් ඉදිකළේ යැයි සඳහන් ආගමික සිද්ධස්ථාන

දඹදෙණිය ප්‍රදේශයේ පිහිටි පොත්ගුල් කන්ද විහාරය හා පුහුලේ විහාරය ද මෙම රාජධානිය පැවති අවධියේ ආරම්භ වූ ස්ථානයන් ය. වාචිස්සර හිමියන් යටතේ පැවති රාජකීය පොත්ගුල් විහාරය මෙය විය හැකි ය. ඉහත සඳහන් කළ පුහුලේ විහාරය දඹදෙණිය අවධියේ නිර්මාණය වූ ලෙන් විහාරයකි. දෙවැනි පැරකුම් රජුගේ බිසවක මෙම ස්ථානය දැක ගැනීමෙන් පසු ව මෙම ලෙන් විහාරය කර වූ බව සඳහන් වේ. කෑගල්ල ගල්බොඩ කෝරළේ පිහිටා තිබෙන පදීදොර විහාරය පළමු භුවනෙකබාහු රජු විසින් ඉදි කරන ලද්දකි. ශ්‍රී සංඝබෝධි ශ්‍රී භුවනෙකබාහු රජමහා විහාරය නමින් ද මෙය හඳුන්වයි. ගම්පොළ කහටපිටිය ගමේ පිහිටි ගංගාතිලක රජමහා විහාරය දඹදෙණි යුගයේ ඉදි වූවකි. මෙහි වැඩ සිටින බෝධීන් වහන්සේ දෙවන පැරකුම් රජුගේ ඇමතිවරයකු වූ දේවප්‍රතිරාජ විසින් රෝපණය කරන ලදැයි විශ්වාස කෙරේ. තැම්පිටිගොඩ විහාරය දඹදෙණියට ආසන්න ගල්ගමුවේ පිහිටා තිබෙන අතර එය මේ යුගයට අයත් යැයි සැලකේ. චූළනාග විහාරය දඹදෙණි අවධියට පෙර සිට ම පැවත එන ස්ථානයකි. මලියදේව මහරහතන් වහන්සේ ඡඡක්ක සූත්‍රය දේශනා කළ ස්ථානවලින් එකක් ලෙස සැලකේ. ත්‍රිපිටක චූළනාග හිමියන් වැඩ සිටි ස්ථානය මෙය ලෙස සැලෙක්. දෙවන පැරකුම්බා රජු විසින් මෙම ස්ථානය අලුත් වැඩියා කළ බව සඳහන් වේ. දම්පැලැස්ස නමින් හඳුන්වන විහාරය දඹදෙණිය අවධියේ නිර්මාණය වූවකි. වර්තමාන විද්‍යාර්ථාලංකාර පිරිවෙන පිහිටා ඇත්තේ මෙහිය. මෙම ස්ථානයන්ට අමතර ව කෑගල්ල මාවත පත්තුවේ පිහිටි මාකුරාවේ රජමහා විහාරය, ගණේමුල්ලේ පිහිටි රජමහා විහාරය, කවුඩුගම රජමහා විහාරය, පොල්ගහවෙල මඩිතියවෙල ප්‍රදේශයේ පිහිටි මහෙන්ද්‍රාරාමය ආදි ස්ථාන ද දඹදෙණි රාජධානියේ පාලකයන් විසින් ඉදිකරන්නට වූ විහාරස්ථාන ලෙස සැලකේ (සුමනජෝති හිමි, 1961, පිටු. 132-136).

**දඹදෙණි අවධියට අයත් පිරිවෙන් විහාරස්ථාන**

දඹදෙණි රාජධානි සමයේ එහි පහළ වූ පාලකයන් මෙන් ම ඇමැතිවරු විසින් ඉදිකරන ලද පිරිවෙන් විහාරස්ථාන කිහිපයක් පිළිබඳ ව ම තොරතුරු අනාවරණය කරගත හැකි ව තිබේ. දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් තමාගේ නමින් පිරිවෙනක් ආරම්භ කළ බව කියැවෙන අතර එය සේල විහාරය නමින් ද හඳුන්වන්නට වූ බවක් පෙනී යයි. මෙම පිරිවෙන පිළිබඳ ව මහාවංසයේ මෙන් ම නාරංබැද්ද ශිලා ලේඛනයේ ද සඳහන් ව ඇත (මහාවංසය, ද්විතීය භාගය, 1996, පරි. 85. ගාථා. 57, 58., සුමනජෝති හිමි, 1961, පි. 201). මේ පිළිබඳ ව විස්තරයක් ඉහත දී ද සඳහන් කොට ඇත. දෙවන පරාක්‍රමබාහු රජුගේ සහෝදරයා වන උපරාජ භුවනෙකබාහු රජතුමා විසින් පලාබත්ගල ආරණ්‍යසේනාසනය තුළ භුවනෙකබාහු නමින් පිරිවෙනක් කළ බව සඳහන් ය. ඒ පිළිබඳ ව විස්තරයක් ඉහත ද දක්වා ඇත. මීට අමතර ව භුවනෙකබාහු පිරිවෙන හා මහා මහෙන්ද්‍රබාහු පිරිවෙන නමින් පිරිවෙන් දෙකක් ගැන තොරතුරු හමුවේ. මෙම පිරිවෙන් දෙක කුරුණෑගල වර්තමානයේ අංගංගල නම් ස්ථානයේ පිහිටා ඇති බවට හඳුනා ගැනේ. මෙම ස්ථාන දෙක භුවනෙකබාහු ආදිපාදවරයාත් බෝසත් විජයබාහු රජතුමාත් යන දෙදෙනා විසින් ඉදිකරන ලද ස්ථාන ලෙස සැලකේ (සුමනජෝති හිමි, 1961, පි. 138).

දඹදෙණි අවධියේ ඉදි කරන ලද තවත් පිරිවෙනක් වන්නේ ප්‍රතිරාජ පිරිවෙන යි. එය දෙවන පරාක්‍රමබාහු රජුගේ අමාත්‍යවරයකු වූ දේවපතිරාජයන් විසින් ඉදිකරන ලද්දකි. ඔහු රජුගේ උපදෙස් පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල වෙහෙර විහාරස්ථාන රැසක් ඉදිකරලීමට දායකත්වය සැපවූයේ ය. මෙම පිරිවෙන පළාබත්ගල ඉදි කළ බවක් ඇතැමෙක් කියන අතර තවත් අයෙක් කියනුයේ එය දේව ප්‍රතිරාජයන් විසින් ම වවා වඩාගත් මාදෙල්ගස්ගම (රත්ගම ප්‍රදේශය) පිහිටි බවත් තවත් අයෙක් එය කැරගල ඉදි කළ බවත් තවත් අයෙක් එය අත්තනගල්ලේ ඉදි කළ බවත් කියති (සුමනජෝති හිමි, 1961, පිටු. 139, 140). මේ

සම්බන්ධයෙන් විවිධ මතවාද ඇති නමුත් මෙම ස්ථානය කෑරගල ප්‍රදේශයේ ඉදි කළේ යැයි පිළිගැනීම වඩාත් උචිත ය.

අභයරාජ පිරිවෙන වල්ගම්පායේ පිහිටා ඇති අතර එය බෝසත් විජයබාහු රජතුමා විසින් සිය පියාගේ නමේ කොටසක් සම්බන්ධ කරවමින් ඉදිකරවන ලද්දකි (මහාවංසය, ද්විතීය භාගය, පරි. 88. ගාථා. 51,52). දෙවුන්දර පිහිටි නන්දන පිරිවෙන ද දඹදෙණි අවධියේ නිර්මාණය වූවකි. එය චන්ද්‍රභානු පරාජයට පත් කිරීමෙන් පසු ව දෙවුන්දර ගිය මාපා වීරබාහු විසින් කරවන ලද්දකි (මහාවංසය, ද්විතීය භාගය, පරි. 83. ගාථා. 49,50). සේනානාථ පිරිවෙන අනුරාධපුරයේ තිබූ ස්ථානයක් වන අතර සිව්වන විජයබාහු තෙමේ රුවන්වැලිසෑයේ වැඩකටයුතු මෙම පිරිවෙන්හි හිමියන් ප්‍රමුඛ භික්ෂු සංඝයා ලවා කරවූ බව කියැවේ (මහාවංසය, ද්විතීය භාගය, පරි. 88. ගාථා. 85,86). මෙම අවධියේ තිබූ ප්‍රසිද්ධ පිරිවෙන් විහාරස්ථානයක් වන්නේ මයූරපාද පිරිවෙණයි. එය පූජාවලිය රචනා කළ බුද්ධපුත්‍ර හිමියන් විසූ ස්ථානය ලෙසින් සැලකිය හැකි ය. අනුරාධපුර රාජධානි අවධියේ සිට ම පැවත එන ස්ථානයක් වන මෙය දඹදෙණි අවධියේ වඩාත් ප්‍රචලිත ව පවතින්නට ඇතැයි කල්පනා කළ හැකි ය. මහින්දසේන පිරිවෙන ද මේ අවධියේ තිබූ පිරිවෙන් විහාරස්ථානයකි. පාළි ථූපවංසය ලියූ වාචිස්සර හිමියන් එම කෘතිය සිදු කළේ මහින්දසේන පිරිවෙන්හී වාසය කළ හිමිනමකගේ ආරාධනාවෙන් යැයි සඳහන් කොට තිබේ. එය පොළොන්නරුවේ තිබෙන්නට අතැයි අනුමාන කෙරේ. අනුරාධපුර භුවනෙකබාහු පිරිවෙන භුවනෙකබාහු මහපාණන්ගේ ඉදිකිරීමක් ලෙස සැලකේ. මීට අමතර ව පස් මූළ පිරිවෙන, නන්දි පිරිවෙන හා අස්සද්දනා පිරිවෙන නමින් තවත් පිරිවෙන් විහාරස්ථාන කිහිපයක් ම දඹදෙණි රාජධානි අවධියේ පැවතියේ යැයි හඳුනාගත හැකි ය (සුමනජෝති හිමි, 1961, පිටු. 141-144).

## නිගමනය

ක්‍රි.ව. 1215 සිදු වූ කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ මෙන් ම ආගමික ක්ෂේත්‍රය තුළ ද විශාල

ව්‍යසනයක් මෙන් ම ව්‍යාකූලත්වයක් ඇති වී තිබුණි. ඇති වී තිබුණු දේශපාලන ව්‍යාකූලත්වය කිසියම් දුරකට සමනය කරගැනීමට හැකියාව ලැබුණේ දඹදෙණිය රාජධානියේ සිංහාසනප්‍රාප්ත තෙවන විජයබාහු රජුගේ ක්‍රියාදාමයන් නිසාවෙනි. දඹදෙණිය කේන්ද්‍රකරගෙන දේශපාලන ස්ථාවරත්වය ගොඩනැගූ තෙවන විජයබාහු රජතුමා පරිහානියට හා ව්‍යකූලත්වයට පත් ව තිබුණු සසුන නඟා සිටුවීම සඳහා තත්කාලීන ශාසනාධාරී සංඝයා වහන්සේගේ සහභාගිත්වයෙන් සංඝ සංශෝධනයක් මෙන් ම කතිකාවතක් ද සම්පාදනය කරන්නට අනුග්‍රහය ලබා දෙන ලදි. සිය පිය රජතුමා විසින් සිදු කළ ශාසනික ක්‍රියාදාමයන් තවදුරටත් ඉදිරියට ගෙනයාමට ඔහුගේ අතිජාත පුත්‍රයකු වන දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් කටයුතු කරන ලදි. ඔහු ද සංඝ සංශෝධනයකට හා කතිකාවතක් සම්පාදනය කිරීමට අනුග්‍රහය දැක් වූ බව දඹදෙණි කතිකාවතේ එන විස්තරයෙන් තහවුරු කරගත හැකි ය. සංඝ සමාජයේ චිරස්ථිතිය වෙනුවෙන් මෙබඳු වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවූ දඹදෙණි අවධියේ පාලකයන් ත්‍රිපිටකය ඇතුළු අතීත දැනුම සුරක්ෂිත කිරීම සඳහා පොත් ලියන්නන් ලවා ග්‍රන්ථ සම්පාදනය කිරීමට කටයුතු කරන ලදි. සංඝයා වහන්සේ දහම් දැනුමෙන් පෝෂණය කිරීමට අවධානය යොමු කළ දඹදෙණි අවධියේ පාලකයන් ග්‍රන්ථ සම්පාදනය කරමින් පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීමටත්, සංඝයා වහන්සේට අවශ්‍ය කරන ප්‍රත්‍ය පහසුකම් සලසා දීමටත් කටයුතු කරන ලදි. සසුන ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය කරන භෞතික සම්පත් සංවර්ධනය කිරීමට අවධානය යොමු කළ දඹදෙණි අවධියේ පාලකයන් දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් බෙලිගල හා දඹදෙණියේ දළදා මන්දිර නිර්මාණය කළ අතර, ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී භික්ෂු සංඝයා වෙනුවෙන් නව සංඝාරාම ඉදිකර ඒවායේ නඩත්තුව සඳහා ගම් බිම් කෙත්වතු ප්‍රදානය කිරීමට ද අවධානය යොමු කොට තිබේ. දෙවන පරාක්‍රමබාහු හා ඔහු පුත් සිව්වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු යන පාලකයන් විසින් දිගු කලක් ජරා ජීර්ණ ව පැවති අනුරාධපුරයේ හා පොළොන්නරුවේ මෙන් ම දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි කැලණිය ශ්‍රී පාදය වැනි ස්ථාන ආශ්‍රිත

නිර්මාණ ප්‍රතිසංස්කරණය කිරීමට ද කටයුතු කරන ලදි. ඉහත සඳහන් කළ ආකාරයට පරිහානියට පත් ව තිබූ සෑම ක්ෂේත්‍රයක් ම ආවරණය කරමින් එම තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා දඹදෙණි අවධියේ පාලන නායකත්වයට පත් පාලකයන් සිව් දෙනා විසින් සාධනීය මට්ටමක සිට ප්‍රතිචාර දැක් වූ බැවින් නැවතත් මෙරට ශාසනික සම්ප්‍රදාය නඟා සිටුවීමට හැකියාව ලැබුණු බව මෙයින් පෙන්වාදිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*කව්සිළුමිණි මහා කාව්‍යය*, (1992). කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය*, (1922). සංස්. සයිමන් ද සිල්වා ඇතුළු පිරිස, කොළඹ: රජයේ මුද්‍රණාලය.

*පූජාවලිය*, (2012). සංස්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවංසය*, ද්විතීය භාගය, (1996). සංස්. හික්කඩුවේ සුමඞ්ගල හිමි සහ දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා, නුගේගොඩ: සීමාසහිත දීපානි මුද්‍රණය ප්‍රකාශන (පෞද්ගලික) ආයතනය.

*රාජරත්නාකරය*, (1990). සංස්. දවුල්දෙණ ඤාණිස්සර හිමි සහ ස. ජ. සුමනසේකර බණ්ඩා, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*රාජාවලිය*, (2014). සංස්. ඒ. වී. සුරවීර, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*හත්ථවනගල්ල විහාරවංස*, (2001). සම්පාදක. ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග, කොළඹ: සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

## ද්විතීයික මූලාශ්‍රය

ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, (1995). *පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්*, කැලණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

ගුණාලඞ්කාර වරසමෙබාධි හිමි, (2019). *ගම්පොළ ඉතිහාසය*, නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ.

සුමනජෝති හිමි, දෙගම්මැද, (1961). *දඹදෙණි යුගය*, (ද්විතීය භාගය) වක්කුණුවල: ශ්‍රී සුගත ග්‍රන්ථාකරය.

*ලංකා ඉතිහාසය*, I කාණ්ඩය II භාගය, (2015). විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය, කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.